## Abstract 19

# ක්‍රිස්තියානි දස පනතින් ඉදිරිපත් කෙරෙන ශීල ධර්මය පිළිබඳ අධ්‍යයනයක්

**යූ. ඒ. සී. සුමුදුමලී,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*chathurisumudumalie@gmail.com*

සීමා ව්‍යතික්‍රමණයෙන් සෑම ආගමක ම මූලික අභිලාෂය වන්නේ පුද්ගල සදාචාරය ප්‍රගුණ කිරීම සහ ඒවා සුසංවේදී සමාජ ක්‍රියාවලියක් විෂයයෙහි ප්‍රායෝගික භාවිතයක් සඳහා ක්‍රියාත්මක කිරීමට මග පෙන්වා දීම යි. මෙහි මූලික පියවර වශයෙන් පුද්ගල සදාචාරය සාකච්ඡාවට ගැනේ. ඉන්දියානු ආගමික සංස්කෘතිය තුළ එය අර්ථ ගැන්වෙනුයේ පංචශීලය තුළ ය. අනෙක් ආගමික හා දාර්ශනික චින්තාවන් තුළ ද මෙම ආධ්‍යාත්මික දියුණුව සැලකිල්ලට ගනිමින් කරුණු දක්වා ඇත. ක්‍රිස්තියානි දස පනතෙහි '**ශීල ධර්මය**' නමින් මෙය හැඳින්වේ. ඒ අනුව ශීල ධර්මය කෙනෙකුගේ යහපත් පැවැත්මට හේතු වේ. විශ්වයේ සෑම වස්තුවකට ඊට ම ආවේණික වූ ස්වභාවයක් ඇත. එම ස්වභාවය ක්‍රියාත්මක වන්නේ ඊටම විශේෂ වූ නීතිරීති මාලාවකට අනුව යි. මිනිසාට ද එසේ ම ඔහුට ම සුවිශේෂ වූ ස්වභාවයක් ඇත. එම මිනිස් ස්වභාවය ක්‍රියා කරන්නේ ඊට ම ආවේණික වූ නීතිරීති පද්ධතියක් අනුව ය. එම නීතිරීති මාලාව 'ශීල ධර්මය' සේ හැඳින්වේ. ඕනෑ ම මිනිසෙකුට සදාචාර සම්පන්න මිනිසෙකු විය හැක්කේ එයට අනුකූලව තම චර්යා නියමාකාරයෙන් හැඩ ගස්වා ගැනීමෙන් පමණි. මෙය දක්නට ලැබෙන්නේ යුදෙව් බයිබලයේ '**නික්ම යෑම**' හා '**ද්විතීය නීති සංග්‍රහය**' යන වංශ කථා පොත් දෙකෙහි ය. පුද්ගලයාගේ සංවරය, ශික්ෂණය අරමුණු කොට ගෙන හඳුන්වා දෙනු ලබන මෙය කොටස් දෙකකින් සමන්විත ය. ඉන් පළමු කොටස දෙවියන්ට යුතුකම් දැක්වීමටත්, දෙවෙනි කොටස සමාජය උදෙසා යුතුකම් දැක්වීමටත් කරුණු දක්වයි. මින් පළමු වැන්න නියෝග ස්වරූපයක් ගනී. දෙවැන්නෙහි අන්තර්ගතය පිළිබඳ විමසීමේ දී සමකාලීන පවුල් සංස්ථාව තුළ පැවති ගැටලු හේතුවෙන් ඒවා අවම කරලීමට ගත් උත්සාහයක් බව පෙනී යයි. හින්දු, බෞද්ධ, ජෛන ආගම්වල පංච ශීලයෙන් ඉදිරිපත් කරන කරුණුවලට බොහෝ සෙයින් සමාන මෙකී ශීල ධර්මය පුද්ගල සදාචාරය වර්ධනය කිරීමට ඉවහල් වන්නාවූ ආකාරය පිළිබඳ අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

**ප්‍රමුඛ පද :** ක්‍රිස්තියානි දහම, දස පනත, පංච ශීලය, සදාචාරය, ශීල ධර්ම